WWW.OLEVELAPI.COM



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**63 | S | I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Ord. Level) Examination, 2020

ව්‍යවසායකත්ව අධ්‍යයනය I, II
முயற்சியாண்மைக் கற்கை I, II
Enterpreneurship Studies I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

## ව්‍යවසායකත්ව අධ්‍යයනය I

**සැලකිය යුතුයි:**

(i) **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගන්න.
(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.**
(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

1. 'ව්‍යවසායකයා තමාගේ අභිමතය පරිදි තීරණ ගැනීම හා වැඩ කිරීම සිදු කරයි.' මෙම ප්‍රකාශයෙන් පෙන්නුම් කෙරෙන ව්‍යවසායකත්ව ගති ලක්ෂණය වන්නේ
   (1) නිර්මාණශීලීත්වයයි.
   (2) ස්වයං පෙළඹවීමයි.
   (3) අනාගත දැක්මයි.
   (4) ස්වාධීනත්වයයි.

2. අරමුණු සාර්ථකව ඉටුකර ගැනීම සඳහා ව්‍යවසායකයකු විසින් කළ යුතු ප්‍රධාන කාර්යයක් වන්නේ
   (1) ව්‍යාපාර පරිසර තත්ත්ව විශ්ලේෂණය කර බැලීම ය.
   (2) ව්‍යාපාරයේ පරිපාලන කටයුතු සැලසුම් කිරීම ය.
   (3) ප්‍රාග්ධනය සපයා ගන්නා ආකාරය සොයා බැලීම ය.
   (4) වඩාත් හොඳ ව්‍යාපාරික ස්ථානයක් තෝරා ගැනීම ය.

WWW.OLEVELAPI.COM

3. ව්‍යාපාරිකයකුට වඩා ව්‍යවසායකයකු තුළ දැකිය හැකි සුවිශේෂී ලක්ෂණයක් වන්නේ
   (1) අවදානම් භාර ගැනීමයි.
   (2) පොදු අරමුණක් පැවතීමයි.
   (3) නවෝත්පාදන හඳුන්වාදීමයි.
   (4) ඉහළ ප්‍රතිලාභයක් ලැබීමයි.

4. ව්‍යවසායකයාගේ ලාභය තීරණය කරනු ලබන ප්‍රධාන සාධකයක් වන්නේ
   (1) ව්‍යාපාරික ස්ථානයේ පිහිටීම ය.
   (2) ව්‍යවසායකයාගේ ඇති මිත්‍රශීලීභාවය ය.
   (3) නිෂ්පාදිතයේ ගුණාත්මකභාවය ය.
   (4) භාණ්ඩයේ ලකුණු කළ මිල ය.

5. ස්ථිර රැකියාවක නිරත වන පුද්ගලයකුට වඩා, ව්‍යවසායකයකුට ලැබෙන ප්‍රතිලාභයක් වන්නේ
   (1) කීර්ති ප්‍රශංසා ලබා ගැනීමට හැකි වීම ය.
   (2) නිශ්චිත පරිසර තත්ත්වයක් යටතේ කටයුතු කළ හැකි වීම ය.
   (3) භාවිතයට නොගත් හැකියාවන් භාවිත කළ හැකි වීම ය.
   (4) පහසුවෙන් ඉහළ මූල්‍ය ප්‍රතිලාභයක් ලබා ගත හැකි වීම ය.

[දෙවැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

6. වර්තමානයේ ප්‍රචලිත වෙමින් පවතින 'විද්‍යුත් ගෙවීමේ ක්‍රමය' හැඳින්විය හැක්කේ
   (1) නව සොයා ගැනීමක් ලෙස ය. (2) දිගුවක් ලෙස ය.
   (3) අනුකරණය කිරීමක් ලෙස ය. (4) සංකලනයක් ලෙස ය.

7. ව්‍යාපාරයක, කාලානුරූපීව වෙනස් නොවී කටයුතු කිරීමේ හැකියාව සැලකිය හැක්කේ
   (1) ශක්තියක් ලෙස ය. (2) තර්ජනයක් ලෙස ය.
   (3) දුර්වලතාවක් ලෙස ය. (4) අභියෝගයක් ලෙස ය.

8. ව්‍යාපාරයකට පාලනය කළ හැකි පාරිසරික සාධක ඇතුළත් වන්නේ
   (1) ආසන්නතම පරිසරයට ය. (2) අභ්‍යන්තර පරිසරයට ය.
   (3) බාහිර පරිසරයට ය. (4) ගෝලීය පරිසරයට ය.

9. ව්‍යවසායකයින්ට නිවැරදි තීරණ ගැනීම සඳහා අවශ්‍ය පසුබිම සකසනු ලබන්නේ
   (1) දක්ෂ කළමනාකරුවන් ය. (2) ව්‍යාපාර පරිසර සාධක ය.
   (3) පාරිභෝගික අවශ්‍යතා හා වුවමනා ය. (4) විවිධ දිරිගැන්වීම් ය.

10. ව්‍යාපාර සංවිධානයක පොදු ලක්ෂණයක් වන්නේ
   (1) සීමිත සම්පත් භාවිත කිරීමයි. (2) කළමනාකරණ කාර්යයන් ඉටු කිරීමයි.
   (3) ලාභය අරමුණු කර ගැනීමයි. (4) විධිමත් සැලසුමකට අනුව කටයුතු කිරීමයි.

11. 'ඉලක්කගත පාරිභෝගිකයා' ලෙස හඳුන්වනු ලබන්නේ
   (1) අදාළ භාණ්ඩය හෝ සේවාව දැනටමත් මිලදී ගැනීම සඳහා පොළඹවාගෙන ඇති පාරිභෝගිකයා ය.
   (2) අදාළ භාණ්ඩය හෝ සේවාව මිලදී ගැනීමට කැමති, ආදායමක් ඇති පාරිභෝගිකයා ය.
   (3) අනාගතයේදී අදාළ භාණ්ඩය හෝ සේවාව මිලදී ගැනීමට පොළඹවා ගත හැකි යැයි අපේක්ෂා කරන පාරිභෝගිකයා ය.
   (4) අනාගතයේදී අදාළ භාණ්ඩය හෝ සේවාව මිලදී ගැනීමට ප්‍රමාණවත් ආදායමක් ඇති පාරිභෝගිකයා ය.

12. 'කොවිඩ්-19 වසංගතය ව්‍යාපාර කෙරෙහි බලපෑම් ඇති කරයි.' මෙම සාධකය අයත් වන්නේ
   (1) ප්‍රජා පරිසරයට ය. (2) ස්වාභාවික පරිසරයට ය.
   (3) සමාජ හා සංස්කෘතික පරිසරයට ය. (4) සමාජයීය පරිසරයට ය.

13. ඒකපුද්ගල ව්‍යාපාර, හවුල් ව්‍යාපාර හා සංස්ථාපිත සමාගම් ලෙස ව්‍යාපාර වර්ගීකරණය කිරීමේ පදනම වන්නේ
   (1) හිමිකාරිත්වයයි. (2) අරමුණයි.
   (3) කළමනාකාරිත්වයයි. (4) ව්‍යාපාරයේ ස්වභාවයයි.

WWW.OLEVELAPI.COM

14. සිරිමල් 'විලාසිතා' නමින් ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අදහස් කරයි. මෙම ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීම සඳහා අදාළ වාර්තා, ආකෘති හා ගාස්තු භාරදිය යුත්තේ
   (1) ග්‍රාම නිලධාරි වෙත ය. (2) ප්‍රාදේශීය ලේකම් වෙත ය.
   (3) තැපැල් ස්ථානාධිපති වෙත ය. (4) දිස්ත්‍රික් ලේකම් වෙත ය.

15. ව්‍යවසායකයා තම ව්‍යාපාරයේ විවිධ කාර්යයන් ඉටු කරයි. මේවා අතුරින් සේවකයින් පෙළඹවීම හා ඔවුන්ට අවශ්‍ය මඟපෙන්වීම අයත් වන්නේ
   (1) ව්‍යවසායකයාගේ භූමිකාවට ය. (2) නායකයාගේ භූමිකාවට ය.
   (3) කළමනාකරුගේ භූමිකාවට ය. (4) අයිතිකරුගේ භූමිකාවට ය.

16. ව්‍යවසායකයකු සතුවිය යුතු සංකල්පනාත්මක කුසලතාවක් වන්නේ
   (1) කණ්ඩායමක් වශයෙන් එකට එකතු වී වැඩ කිරීම ය.
   (2) පාරිභෝගික අවශ්‍යතා හා වුවමනා හඳුනා ගැනීම ය.
   (3) විවිධ පාර්ශ්ව අතර තොරතුරු බෙදා හැරීම ය.
   (4) නව වෙළෙඳපොළ සොයා ගැනීම ය.

[තුන්වැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

17. කුඩා පරිමාණ ව්‍යාපාර සාර්ථක කර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ගයක් වන්නේ
    (1) ණය පහසුකම් ලබා නොගෙන ව්‍යාපාර කටයුතු මෙහෙයවීම ය.
    (2) නිවැරදි සැලසුම් සැකසීම සහ ඒවාට අනුව ක්‍රියාත්මක වීම ය.
    (3) සැමවිටම තම අභිමතය පරිදි ව්‍යාපාර කටයුතු සැලසුම් කර පවත්වාගෙන යෑම ය.
    (4) ඉහළ ප්‍රතිලාභයක් සහිත ව්‍යාපාර කටයුත්තක නියැලීම ය.

18. ව්‍යාපාර සැලැස්මක් සකස් කිරීම අවශ්‍ය වන්නේ
    (1) නව ව්‍යාපාරයක් ආරම්භ කිරීමේදී ය.
    (2) සේවකයන් බඳවා ගැනීමේදී ය.
    (3) බැංකු ණයක් සඳහා ඇප ඉදිරිපත් කිරීමේදී ය.
    (4) ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීමේදී ය.

19. ව්‍යවසායකයකු විසින් වෙළඳපොළ විශ්ලේෂණයක් කිරීමේ මූලික අරමුණක් වන්නේ
    (1) අලෙවි සැලැස්ම වඩාත් නිවැරදිව පිළියෙල කර ගැනීම ය.
    (2) නිෂ්පාදන සැලැස්ම වඩාත් නිවැරදිව පිළියෙල කර ගැනීම ය.
    (3) පරිපාලන සැලැස්ම වඩාත් නිවැරදිව පිළියෙල කර ගැනීම ය.
    (4) මූල්‍ය සැලැස්ම වඩාත් නිවැරදිව පිළියෙල කර ගැනීම ය.

20. සීමාසහිත සිරිමෙවන් එන්ටප්‍රයිසස් ආයතනය විසින් තම සේවකයින්ට සේවයට නොපැමිණි දින නොසලකා මාසික වැටුප නියමිත ආකාරයට ගෙවීම් කරන ලදී. මෙම ආයතනය සම්පූර්ණ කරන ලද්දේ
    (1) ආර්ථික වගකීමකි. (2) කාලීන වගකීමකි.
    (3) සදාචාරාත්මක වගකීමකි. (4) නීතිමය වගකීමකි.

21. වර්තමානයේ අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩ නිවසටම බෙදා හැරීමේ සේවාව අයත් වන්නේ
    (1) ප්‍රාථමික අංශයට ය. (2) ද්විතියික අංශයට ය.
    (3) තෘතියික අංශයට ය. (4) නිෂ්පාදන අංශයට ය.

22. සංස්ථාපිත සමාගමකට ගිවිසුම්වලට එළඹීම සඳහා ඇති අයිතිය හිමි වනුයේ
    (1) අධ්‍යක්ෂ මණ්ඩලයකින් පාලනය වන නිසා ය.
    (2) කොටස් නිකුත් කර ප්‍රාග්ධනය රැස්කර ගන්නා නිසා ය.
    (3) නෛතික පුද්ගලභාවයක් හිමිවන නිසා ය.
    (4) වගකීම සීමාසහිත වන නිසා ය.

WWW.OLEVELAPI.COM

23. හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යාම වඩාත් යෝග්‍ය වන්නේ
    (1) ලිඛිතව ය. (2) වාචිකව ය.
    (3) ව්‍යංගයෙන් ය. (4) ලියාපදිංචි කිරීමෙන් ය.

24. 'වුවමනා' සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
    (1) වුවමනා උත්පත්තියත් සමග ම ඇති වේ.
    (2) වුවමනා කාලානුරූපීව වෙනස් නොවේ.
    (3) වුවමනා නිර්මාණය කරනු ලබන්නේ ව්‍යවසායකයින් විසින් ය.
    (4) වුවමනා පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් නොවේ.

25. ව්‍යවසායකත්වයට **එරෙහිවන** ප්‍රධාන සමාජයීය සාධකයක් වන්නේ
    (1) අධ්‍යාපනය තුළින් ව්‍යවසායකත්වය දිරිමත් කිරීම ය.
    (2) ව්‍යවසායකත්වය සඳහා ප්‍රමාණවත් රාජ්‍ය දිරිගැන්වීම් තිබීම ය.
    (3) වැටුප් ලබන රැකියා සඳහා ඉහළ පිළිගැනීමක් තිබීම ය.
    (4) අවදානම් භාර ගැනීමට නව ව්‍යවසායකයින් තුළ ඇති කැමැත්ත ය.

[හතරවැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

26. කාන්තා ව්‍යවසායකත්වයට බාධාවක් වන්නේ
   (1) සම්ප්‍රදායෙන් ඔබ්බට ගොස් ව්‍යාපාර කටයුතු කිරීමට ඇති අවස්ථා බහුල වීම ය.
   (2) පෞද්ගලික ජීවිත භූමිකාව හා ව්‍යවසායකත්ව භූමිකාව සමබරව පවත්වා ගැනීමට ඇති අවශ්‍යතාව ය.
   (3) කාන්තාවන් ඉහළ අධ්‍යාපනයක් ලබන නිසා රැකියා අවස්ථා බහුල වීම ය.
   (4) ජනගහනයෙන් බහුතරයක් කාන්තාවන් වීම නිසා කාන්තා ව්‍යවසායකත්වයට තරගකාරීත්වයක් පැවතීම ය.

27. අමුද්‍රව්‍ය පිරිවැය සැලකිල්ලට ගනු ලබනුයේ
   (1) නිෂ්පාදන පිරිවැය ගණනය කිරීමේදී ය.
   (2) නිෂ්පාදන නොවන පිරිවැය ගණනය කිරීමේදී ය.
   (3) අලෙවි හා බෙදාහැරීමේ පිරිවැය ගණනය කිරීමේදී ය.
   (4) ආයෝජන පිරිවැය ගණනය කිරීමේදී ය.

28. වරලත් හිමියා විසින් තම වෙළඳ නාමය යටතේ භාණ්ඩ විකිණීම වෙනුවෙන් වරලත් ලාභියාගෙන් ගාස්තුවක් අය කෙරේ. මෙය හඳුන්වන්නේ
   (1) කල්බදු ලෙස ය.
   (2) පුරස්කාරය ලෙස ය.
   (3) කොමිස් මුදල ලෙස ය.
   (4) නියෝජිත ගාස්තු ලෙස ය.

29. ව්‍යාපාරවල නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ හා සේවාවල තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය ලබා දෙන උපදෙස් සැලකිය හැක්කේ
   (1) යටිතල පහසුකමක් ලෙස ය.
   (2) මූල්‍ය දිරිගැන්වීමක් ලෙස ය.
   (3) මූල්‍ය නොවන දිරිගැන්වීමක් ලෙස ය.
   (4) විකුණුම් ප්‍රවර්ධනයක් ලෙස ය.

30. ව්‍යවසායකත්ව සංස්කෘතියක් තුළ ක්‍රියාත්මක වන ව්‍යවසායකයකු
   (1) සැමවිටම සාර්ථකත්වය අපේක්ෂා කරන්නෙකු වේ.
   (2) නවෝත්පාදනයේ යෙදෙන්නෙකු වේ.
   (3) සමාජ සම්මතයන් කෙරෙහි දැඩි විශ්වාසයෙන් කටයුතු කරන්නෙකු වේ.
   (4) පරිසරය විශ්ලේෂණය නොකර ව්‍යාපාර අවස්ථා හඳුනාගෙන ව්‍යාපාර කටයුතු කරන්නෙකු වේ.

31. සුනිල් තම ඉතිරි කරගත් මුදලක් යොදවා, තම අභිමතය පරිදි පවුලේ සාමාජිකයින් සම්බන්ධ කර ගනිමින් තමා ජීවත්වන ප්‍රදේශයේ ව්‍යාපාරයක් පවත්වාගෙන යයි. මෙම ලක්ෂණවලට අනුව සුනිල්ගේ ව්‍යාපාරය
   (1) මධ්‍ය පරිමාණ ව්‍යාපාරයකි.
   (2) වරලත් ව්‍යාපාරයකි.
   (3) කුඩා පරිමාණ ව්‍යාපාරයකි.
   (4) හවුල් ව්‍යාපාරයකි.

WWW.OLEVELAPI.COM

32. දියුණු වෙමින් පවතින රටක් වශයෙන් ශ්‍රී ලංකාව තුළ ව්‍යවසායකත්ව සංස්කෘතියක් බිහි කිරීම අවශ්‍ය වන්නේ
   (1) ආර්ථික වර්ධනය ස්ථාවර මට්ටමක පවත්වා ගැනීම සඳහා ය.
   (2) සම්පත් පවතින ආකාරයෙන් ම පවත්වා ගෙන යාම සඳහා ය.
   (3) නව රැකියා නිර්මාණය කරන්නන් බිහි කිරීම සඳහා ය.
   (4) තරගකාරිත්වය පාලනය කිරීම සඳහා ය.

33. 'සමාජයීය ව්‍යවසායකයා' යනු
   (1) පවතින භාණ්ඩ හෝ සේවා තවදුරටත් නවීකරණයට ලක් කරන්නා ය.
   (2) සමාජයේ ගැටලුවලට නිර්මාණාත්මක විසඳුම් ඉදිරිපත් කරන්නා ය.
   (3) නව භාණ්ඩ හෝ සේවා සමාජයට ඉදිරිපත් කරන්නා ය.
   (4) ව්‍යාපාරයේ අභ්‍යන්තර ගැටලුවලට නිර්මාණශීලී විසඳුම් ඉදිරිපත් කරන්නා ය.

[පස්වැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

34. සීමාසහිත පෞද්ගලික සමාගමක දැකිය නොහැකි ලක්ෂණයක් වන්නේ
   (1) එක් පුද්ගලයකුට වුව ද ආරම්භ කළ හැකි වීම ය.
   (2) නෛතික පුද්ගලභාවයක් හිමි වීම ය.
   (3) පොදු ජනතාවට කොටස් විකිණිය හැකි වීම ය.
   (4) ගිණුම් තැබීම හා විගණනය අනිවාර්ය වීම ය.

35. අරුණ නැවුම් සුවඳකින් යුත් නව සබන් වර්ගයක් දේශීය වෙළඳපොළට ඉදිරිපත් කරයි. අරුණ වෙළඳපොළට ප්‍රවේශ වන්නේ
   (1) පවතින භාණ්ඩයක් පවතින වෙළඳපොළට ඉදිරිපත් කරමින් ය.
   (2) පවතින භාණ්ඩයක් නව වෙළෙඳපොළට ඉදිරිපත් කරමින් ය.
   (3) නව භාණ්ඩයක් පවතින වෙළඳපොළට ඉදිරිපත් කරමින් ය.
   (4) නව භාණ්ඩයක් නව වෙළඳපොළට ඉදිරිපත් කරමින් ය.

36. ව්‍යාපාරයක් කෙරෙහි උනන්දුවන පාර්ශ්වයක් වන අයිතිකරුගේ ප්‍රධානතම අපේක්ෂාව වන්නේ
   (1) ආයෝජන සුරක්ෂිතභාවයයි.   (2) සමාජයීය සුරක්ෂිතභාවයයි.
   (3) සේවක සුරක්ෂිතභාවයයි.   (4) පරිසර සුරක්ෂිතභාවයයි.

37. 'තරගකරුවන්ගේ සැපයුම් විශ්ලේෂණය' ඇතුළත් වන්නේ
   (1) අලෙවි සැලැස්මෙහි ය.   (2) නිෂ්පාදන සැලැස්මෙහි ය.
   (3) පරිපාලන සැලැස්මෙහි ය.   (4) මූල්‍ය සැලැස්මෙහි ය.

38. ව්‍යාපාරයක ඇස්තමේන්තුගත වියදම් කිහිපයක් පහත දැක්වේ.
   A – ව්‍යාපාර සැලැස්ම සකස් කිරීම රු. 15 000
   B – ව්‍යාපාරය ලියාපදිංචි කිරීම රු. 2 500
   C – ව්‍යාපාර ගොඩනැගිල්ල මිලදී ගැනීම රු. 200 000
   D – විකිණීම සඳහා භාණ්ඩ මිලදී ගැනීම රු. 50 000

   මෙවායින් ව්‍යාපාරය ආරම්භ කිරීමට පෙර වියදම් වන්නේ
   (1) A හා B පමණි.   (2) A හා C පමණි.   (3) A, B හා C පමණි.   (4) A, B, C හා D සියල්ලම ය.

39. ව්‍යාපාරයක් සමාජයීය වගකීම් පිළිපැදීමෙන් ලැබෙන ප්‍රතිලාභයක් වන්නේ
   (1) ව්‍යාපාරයේ සේවක සුභසාධනය ඉහළ යාම ය.
   (2) ව්‍යාපාරයේ දිගුකාලීන පැවැත්ම ස්ථාපිත වීම ය.
   (3) ව්‍යාපාරික කටයුතු කෙරෙහි ඇති අවදානම අඩුවීම ය.
   (4) ව්‍යාපාරික සැලසුම් සකස් කිරීමේ වියදම් අඩුවීම ය.

40. ප්‍රකාශ් තම ව්‍යාපාරය සඳහා ඉතිරි කරගත් රු. 400 000 ක මුදල ආයෝජනය කිරීමටත් රු. 300 000 ක බැංකු ණය මුදලක් හා කුලී පදනම මත වර්ෂයකට රු. 120 000කට ගොඩනැගිල්ලක් ලබා ගැනීමටත්, රු. 80 000කට ලීබඩු මිලදී ගැනීමටත් අපේක්ෂා කරයි.
   ඉහත තොරතුරුවලට අනුව ප්‍රකාශ්ගේ ව්‍යාපාරයේ ඇස්තමේන්තුගත
   (1) මුළු අයෝජනය රු. 400 000 කි.
   (2) මුළු මුදල් ගලා ඒම් රු. 300 000 කි.
   (3) මුළු මුදල් ගලා යෑම් රු. 200 000 කි.
   (4) මුළු ස්ථාවර වත්කම් රු. 200 000 කි.

* *

[හයවැනි පිටුව බලන්න.

WWW.OLEVELAPI.COM
අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....